# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

‘ඉසුරුපාය’, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
‘இசுருபாய’, பத்தரமுல்ல, இலங்கை.
‘Isurupaya’, Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. : ඊඩී/5/68/5/4/3/තාව

ඔබේ යොමුව / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2018.0[illegible]

චක්‍රලේඛ අංක 22/2018

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම ජාතික පාසල්වල විදුහල්පතිවරුන්

**<u>ජාතික පාසල් වලට අයත් නිල නිවාස වෙන්කර දීම</u>**

ජාතික පාසල් වලට අයත් නිල නිවාස ඒ සඳහා හිමිකම ඇති නිලධාරීන් අතර, ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති පරිපාටි අනුගමනය කර වෙන් කර දීමේ දී පහත උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

I. ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 1 වන වගන්තිය අනුව වර්ග කරන ලද උපලේඛන ගත නිවාස හැකිතාක් දුරට එම තනතුරට හෝ ශ්‍රේණියට අයත් නිලධරයෙකු වෙතම වෙන් කර දීමට කටයුතු කළ යුතුය. එසේ උපලේඛන ගත නිලධාරීන් නොමැති විට හෝ එම නිලධාරීන් අදාළ නිවාසය අනවශ්‍ය බව ලිඛිතව දැනුම් දෙන අවස්ථාවලදී සියලු කරුණු ඇතුළත් වාර්තාවක් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අදාළ නිල නිවාසය වෙනත් නිලධරයෙකු වෙත ලබාදීමට විශේෂ අවසරයක් ලබාගත යුතුය.

II. පොදු සේවා නිවාස තිබේ නම් ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 4.1 වගන්තිය අනුව නිවාස ලැබීමට සුදුසුකම් තීරණය කළ යුතුය.

III. නිවාස ලාභීන් තෝරාගැනීමේදී ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 4:2, 4:3 සහ 4:4 වගන්තිවල උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර 4:4:1 වගන්තිය අනුව කටයුතු කරන්නේ නම් ජාතික පාසල් අධ්‍යක්ෂ හා අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශය සහිතව ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වේ.

IV. නිවාස කුලී සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුව කටයුතු කළයුතු අතර අයකර ගන්නා ලද නිවාස කුලී පිළිබඳ සෑම ලිත් වර්ෂයකම සංක්ෂිප්ත වාර්තාවක් ඊලඟ ලිත් වර්ෂයේ පළමු කාර්තුව අවසන් වීමට ප්‍රථම ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. නිල නිවාසය, එහි වර්ගය, වෙන් කර දී ඇති නිලධරයා සහ ඔහුගේ තනතුර, මුල්වරට ඔහුට වෙන්කර දුන් දිනය , නිවසේ තක්සේරු වටිනාකම, නිලධරයාගෙන් ජනවාරි සිට දෙසැම්බර් දක්වා අයකර ගෙන ඇති නිවාස කුලිය එම වාර්තාවට ඇතුළත් විය යුතුය.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister : +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary : +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk

V. ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6 වැනි වගන්තියේ සඳහන් බදු කොන්දේසි තරයේ අනුගමනය කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාවට නැංවිය යුතුය.

VI. ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 7 වැනි සහ 9 වැනි වගන්ති යටතේ කටයුතු කිරීමේ බලතල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පවරනු ලබන අතර ඒ අනුව ඔවුන් ගනු ලබන ක්‍රියා මාර්ග අප්‍රමාදව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ද දැන්විය යුතුය.

VII. ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 8 වැනි වගන්තිය යටතේ කටයුතු කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීමක් වන අතර අදාළ පාසලේ විදුහල්පතිවරයා විසින්ද එම බඩු වට්ටෝරු පොතෙහි (ඉන්වෙන්ටරි) පිටපතක් තබාගත යුතුය.

VIII. ඉහත උපදෙස් අනුව කටයුතු කිරීමේදී නිල නිවාස වල තත්ත්වය හා නඩත්තුව සම්බන්ධයෙන් අදාළ විදුහල්පතිවරුන් අවධානය යොමු කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හි අප්‍රමාදව හා ලිඛිතවම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කර අදාළ නඩත්තු කටයුතු කඩිනමින් කළ යුතුය.

02. නිලනිවාස හිමිකම නොමැති නිලධාරීන් වෙත කිසිදු හේතුවක් මත නිලනිවාස වෙන් කර නොදිය යුතු අතර, දැනටමත් එසේ වෙන්කර දී තිබේ නම් මෙම චක්‍රලේඛයේ දාතම සිට සයමසක් ගතවීමට පෙර ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7 හා 9 වගන්ති යටතේ කටයුතු කර එම නිවාස ආපසු ලබාගෙන විධිමත් පරිදි සුදුසු නිලධාරීන්ට වෙන්කරදීමට කටයුතු කළ යුතුය.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය